**ජාතික යොවුන් සේනාංකය - 2020**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කල මතය**

**-------------------------------**

ජාතික යොවුන් සේනාංකයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින සේනාංකයට අයත් පිරිවැය රු.432,263,958 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 03 ප්‍රකාරව ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | කෙටි කාලයක් තුල අදාල වත්කම් සියල්ලම අගය කිරීමට නොහැකි බැවින්, සංගීත භාණ්ඩ සහ ක්‍රීඩා භාණ්ඩ පමණක් 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනයේ ගැලපුම් සිදුකර ඇත.<br>ඉතිරි වත්කම් ඉදිරි වර්ෂය තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීම සහ නියමිත හෙළිදරව් කිරීම් කල යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 93 වන වගන්තිය අනුව අස්තිත්වයක් විසින්, රේඛීය අයිමතවල වැඩිදුර උපවර්ගීකරණයක් ඉදිරිපත් කරන විට, අස්තිත්වයේ මෙහෙයුම් වලට උචිත ආකාරයට ඒවා වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි හෝ සටහන්වල ඉදිරිපත් කළ යුතු වුවද සේනාංකයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.2,236,026,793 ක් වූ කෙරීගෙන යන වැඩ සඳහා විස්තරාත්මක සටහනක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ කෙරීගෙන යන වැඩ හි විස්තරාත්මක සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් පාරිතෝෂිත වෙන්කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් | ජාතික යොවුන් සේනාංකයේ පාරිතෝෂිත ගෙවීම් ගණනය කිරීම සඳහා මෙතෙක් පශ්චාත් පාරිතෝෂිත වෙන් කිරීම් ප්‍රතිපත්තියක් සකස් කර නොමැති බව පිළිගන්නා අතර, ඉදිරියේදී එම ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවකයින් 404 ක් සඳහා පාරිතෝෂිත ලෙස රු. 37,083,980 ක් වෙන්කර තිබුණද ඒ සඳහා පශ්චාත් පාරිතෝෂිත වෙන්කිරීම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | | |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඊ) ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු වුවද සේනාංකය විසින් ආදායම්, වියදම්, රාජ්‍ය ප්‍රදාන ලැබීම්, කෙටිකාලීන ආයෝජන, ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂය මූල්‍ය ප්‍රකාශන තුල මෙම ගිණුම් කරණ ප්‍රතිපත්ති හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී නියමිත හෙලිදරව් කිරීම් කල යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදි ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු රු.1,077,517,669 ක් පිරිවැය වූ පුහුණු මධ්‍යස්ථාන 15 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට 2020 දෙසැම්බර් 31 දින වන විටත් කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල භාවිතයට ගෙන තිබුණු රු.682,875,647 ක් පිරිවැය වූ පුහුණු මධ්‍යස්ථාන 09 ක් සඳහා වාර්ෂික ක්ෂය වියදම රු.34,143,782 ක්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සේනාංකය විසින් Excel මෘදුකාංගයක් අධාරයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යන ලදී. 2016 – 2018 වර්ෂයන් තුල නියමු ව්‍යාපෘතිය යටතේ ස්ථාවර වත්කම් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීම හේතුකොට ගෙන එම ලේඛණය යාවත්කාලීන කිරීමේදී ප්‍රායෝගික ගැටලු රැසක් මතු විය. ඒ අනුව තුල සිදු වූ වත්කම් නැවත අගය කිරීමත් සමඟ ස්ථාවර වත්කම් ලේඛණය, 2021 වර්ෂය යාවත්කාලීන කර ගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතු වීම |
| (ආ) 2019 වර්ෂයේ දී සේවයෙන් ඉවත් වූ කාර්ය මණ්ඩලයේ 37 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණු රු.3,604,183 ක පාරිතෝෂිත මුදල ලෙස පෙර වර්ෂ ගැලපීමක් ලෙස සමුච්චිත ඌණතාවයට ගලපනු වෙනුවට 2020 වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් 2020 වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවීම් කරන ලද නමුත් | වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීමේ ශේෂය ගණනය කිරීමේදී අතපසු වීමකින් සේවකයින් 37 ක් සඳහා වෙන් කර නොතිබූ ප්‍රමාණය සහ 2020 වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම් ශේෂය හා පාරිතෝෂිත වියදම වැඩියෙන් දක්වා තිබීමේ වරද 2021 වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීමේ ප්‍රකාශය සකස් කිරීමේදී නිවැරදි කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතු වීම |

2021 වර්ෂයට අදාළ රු.2,187,544 ක් වූ වියදම් අයිතම 10 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා අතිරික්තය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ වල දක්වා ඇති සේනාංකයෙන් පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2015 සිට 2020 දක්වා පරිහරණය කරන ලද විදුලිය හා ජල පරිභෝජනයට අදාළව හා වරිපනම් වෙනුවෙන් අයවිය යුතුව පැවති රු.13,144,155 ක් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 25 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | එම ආයතනය වෙතින් 2021 වර්ෂයට අදාලව වියදම් වෙනුවෙන් ගෙවීම් මේ වන විට සිදු කර ඇත. එසේම පසුගිය වර්ෂයන් සඳහා වූ වියදම් ගෙවීම් කිරීමට ප්‍රතිපාදන එම ආයතනය සතු නොවන බව දන්වා ඇති අතර, විගණන කළමනාකරණ කමිටුව විසින් ලබා දුන් උපදෙස් අනුව එම කරුණ ජාතික යොවුන් සේනාංක සභාව වෙත ඉදිරිපත් කර ඒ අනුව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පියවර ගෙන ඇත | සේනාංකය වෙත ලැබිය යුතු අයවීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2. ගෙවිය යුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 සිට 2019 වර්ෂය දක්වා කාල සීමාවට අදාළ නිරවුල් නොකළ එකතුව රු.59,901,715 ක් වූ ගෙවිය යුතු ශේෂයන් 19 ක් නිරවුල් කිරීමට හෝ තවදුරටත් වගකීමක් නොමැතිනම් මූල්‍ය ප්‍රකාශනවල නැවත ගැලපුම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | විමසුම මගින් පෙන්වා දී ඇති 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු පැරණි ශේෂයන් වන රුපියල් 59,901,715 ක මුදලට අදාල සියලුම බැදීම් මේ වන විට නිරවුල් කරමින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදිව දක්වා ඇත | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් වැඩ අවසන් කරන ලද පුහුණු මධ්‍යස්ථාන 03 ක්, ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද පුහුණු මධ්‍යස්ථාන 04 ක් හා මූලික ප්‍රමාණපත් වල අඩුපාඩු පැවතීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා ඇති පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට ලබා දී තිබූ එකතුව රු.73,300,221 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් මේ වන විටත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෝමරන්කඩවල පෙර සවි ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සම්බන්ධයෙන් අවසන් නිගමනයකට පැමිණි පසු කඩිනමින් ඉතිරි අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලබයි | ඉදිකිරීම් අත්තිකාරම් අප්‍රමාදව නිරවුල් කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය (NEMO) වෙත ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ලබාදී තිබුණි. අදාළ ඉදිකිරීම් ප්‍රගතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2020 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තු අවලංගු කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් NEMO ආයතනය වෙත 2016 හා 2017 වර්ෂ වලදී ලබාදී තිබුණු රු.109,234,674 ක් වූ මුළු අත්තිකාරම් මුදලින් රු.43,856,413 ක් මෙම ඉදිකිරීම් කටයුතු අවලංගු කර වසර දෙකක් ගත වී තිබියදීත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ජාතික යන්ත්‍රෝපකරණ ආයතන විසින් රඳවා ඇති මුදල් සහ ගෙවීමට ඇති බිල්පත් වලින් රු:65,378,261.28 ක් අය වීමට තිබූ රු:109,234,674.36 ක මුදලින් නිරවුල් කර ඇති අතර තව දුරටත් නිරවුල් විය යුතු රු:43,856,413. ක් වන අත්තිකාරම් මුදල ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සමඟ අවසන් ගිණුම් කටයුතු සිදු කිරීමේදී කඩිනමින් නිරවුල් කරනු ඇත. | කොන්ත්‍රාත් පරිපාලනය විධිමත් අයුරින් සිදු කළ යුතු වීම සහ අය වීම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>**(i)** 5.1 ඡේදය | සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂය ආවරණය වන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර විධායක කමිටුව සඳහා ඉදිරිපත් කර අනුමැතියක් ලබා ගෙන නොමැති බව පිළිගනිමි.<br>ඒ අනුව 2023 – 2027 වර්ෂයන් සඳහා වූ ජාතික යොවුන් සේනාංක අධිකාරි පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනත් සමඟ ඒ හා සමගාමීව ඇතුලත් විය යුතු කරුණු ඇතුළත් විධිමත් සංයුක්ත සැලැස්මක් සම්පාදනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කර අවසන්ව ඇත. | සේනාංකයේ සංයුක්ත සැලැස්ම අප්‍රමාදව පිළියෙල කර එය වාර්ෂිකව යාවත්කාලීන කල යුතු වීම. |
| **(ii)** 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සේනාංකය විසින් නියමිත දිනට මාස 09 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් 19 උවදුර වැනි ස්වාභාවික තත්වයන් හේතුවෙන් රටතුළ පැනවූ නිරෝධායන ඇඳිරිනීතිය වැනි තත්වයන් හේතුවෙන් 2020 වර්ෂයට අදාල වාර්ෂික ගිණුම් සකස් කර අවසන් කිරීම ජුනි මස දක්වා ප්‍රමාද වූ බව පිළිගනිමි. 2020 වාර්ෂික ගිණුම් වාර්තාව සඳහා 2021/10/27 වන දින සභා අනුමැතිය ලද පසු 2021/11/25 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද බව පැහැදිලි කරමි | ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන අප්‍රමාදව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,250,224 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 65,630,802 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.85,881,026 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට තරුණ සංවර්ධන වියදම රු. 102,514,194 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික යොවුන් සේනාංකයේ ප්‍රධාන කාර්යාලයේ භාවිතා වන ලියාපදිංචි අයිතිය වෙනත් අමාත්‍යාංශ හා ආයතන සතු වටිනාකම රු.29,050,000 ක් වන වාහන 07 ක් මෙතෙක් සේනාංකය නමින් පවරාගෙන නොතිබුණු අතර සේනාංකය විසින් 2020 දෙසැම්බර් 31 දිනට පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ඉඩම් සංඛ්‍යාව 64 ක් වන අතර එම ඉඩම් අතරින් ඉඩම් 19 ක් පමණක් සේනාංකයට පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 45 හි පවරා ගැනීම් කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි | යොවුන් සේනාංක ප්‍රධාන කාර්යාලය විසින් පරිහරණය කරනු ලද LK 6091 ලොරි රථය, PD 9016, PE 0914 හා GC 4505 අංක දරණ රථ වල ලියාපදිංචි අයිතිය යොවුන් සේනාංකය වෙත පවරා ගැනීමට අවශ්‍ය අනුමැතිය අදාල ආයතන වෙතින් මේ වන විට ලබා දී ඇති අතර, ඊට අනුව ඉදිරි කටයුතු කරමින් පවතී. | සේනාංකයේ අරමුණු ඉටුකරලීම සඳහා වත්කම් කළමනාකරණය කාර්යක්ෂම ලෙස සිදු කළ යුතු වීම. |

### 3.4 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේනාංකයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 18 කින් තනතුරු 05 ක් පුරප්පාඩු වී පැවතුණි. තවද අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ සංවර්ධන සහකාර හා කළමනාකාර සහකාර තනතුරු සඳහා පිළිවෙළින් 122 ක් හා 28 ක් බැගින් පුරප්පාඩු පැවතුණි. කොන්ත්‍රාත් පදනම මත අනුමත තනතුරු 297 ක් පැවති අතර එයින් මධ්‍යස්ථානාධිපති, සහකාර මධ්‍යස්ථානාධිපති, සහකාර අධ්‍යක්ෂ සහ සරඹ උපදේශක යන තනතුරු වලට අයත් පුරප්පාඩු 57 ක් පැවතුණි. | රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවකයින්ට හිමි වන වරප්‍රසාද හා පහසුකම් යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයට හිමි නොවන බැවින් එවැනි ආයතනය තනතුරක පත්වීමට අවස්ථාව ලැබෙන යොවුන් සේනාංක සේවකයින් යොවුන් සේනාංක සේවයෙන් ඉවත්වීමට නිරන්තරයෙන් සිදු වේ. 2020 වර්ෂය තුලද උපාධිධාරී පත්වීම් ලබා දුන් බැවින්, යොවුන් සේනාංකයේ සිටි උපදේශකවරුන් සැලකිය යුතු ප්‍රමාණයක් සේවයෙන් ඉවත් වූ නිසා මෙම පුරප්පාඩුව දැක ගත හැකි විය. | පුරප්පාඩු තනතුරු අප්‍රමාදව සම්පූර්ණ කිරීමට කටයුතු කර සේනාංකයේ මානව සම්පත් කළමනාකරණය කාර්යක්ෂමව සිදු කළ යුතු වීම. |